# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2067/16 - 2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(x).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2018 ජනවාරි මස 24 වැනි දින අංක 2055/31 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

කබීර් හෂීම්,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ දී ය.

### I වන උපලේඛනය

***කොන්දේසි***

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී-

(අ) ජෛව විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් අතරින් එකවර "S" සාමාර්ථ තුනක් (03) ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

1A - PG3996 - 507(2018/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් "S" සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

***II වන උපලේඛනය***

| 1 වන තීරය<br>උපාධිය | 11 වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඒඩීගෞරව (ජෛව විද්‍යා) |
| ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඒඩීගෞරව (ඉංග්‍රීසි) |

05 - 40

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.